කථන/தொலைபேசி இல/Telephone Nos
ත්‍යතුමා / மைச்சர் / nister } 2784832, 2784807, 2785617
කම් / யலாளர் / cretary } 2784812
ර්යාලය / லுவலகம் / fice } 2785141-50, Fax: 2784846
මේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education
"ඉසුරුපාය"
බත්තරමුල්ල
"இசுருபாய"
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

පාසල් කටයුතු හා පෞද්ගලික පාසල් ශාඛාව
ED/01/12/01/03/13

ඔබේ අංකය / உமது இல. / Your No. } ......................................

මගේ අංකය / எனது இல. / My No. } ......................................

දිනය / திகதி / Date } 2004.07.21

චක්‍රලේඛ අංක : 2004/27

සියළුම පළාත් අධ්‍යාපන ලේකම් වරුන්,
අධ්‍යාපන අධ්‍යක්ෂ වරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වරුන්,
කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ වරුන්,
විදුහල්පති වරුන් වෙත.

**පාසල පදනම් කරගත් ඇගයීම් - 10, 11, 12 ශ්‍රේණි, පාසල්වලට අ.පො.ස. (උසස් පෙළ) සිසුන් ඇතුලත් කර ගැනීම.**

පාසල්වලට ළමයින් ඇතුළත් කරගැනීමට අදාළව නිකුත් කර ඇති 2004.05.31 දිනැති 2004/18 චක්‍ර ලේඛයේ iv වන කොටසේ අ.පො.ස. (උ.පෙළ) (12 ශ්‍රේණියට) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම පිළිබඳව දක්වා ඇත.

එම කොටසේ අංක 17.0 (ඇ) ඡේදයේ 1 වන වගන්තියට අනුව 2002 දෙසැම්බර් මස හා ඉන් ඉදිරියට පැවැත්වෙන අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල මත අ.පො.ස. (උසස් පෙළ) හැදෑරීමට අවශ්‍ය සුදුසුකම් දක්වා ඇත. ඒ අනුව උසස් පෙළ පංතියට ඇතුළත්වීමට අවශ්‍යවන සම්මාන සාමාර්ථ සංඛ්‍යාවෙන් එක් සම්මාන සාමාර්ථයක් පමණක් පාසල පදනම් කරගත් ඇගයීම් යටතේ ලබා ගත හැකි බව දක්වා ඇත.

එහෙත් දෙවන වරට පාසලින් අ.පො.ස. (සා.පෙළ) විභාගයට ඉදිරිපත් වන සිසුන් සඳහා දැනට පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රියාත්මක නොවේ. එසේ පාසල් පාදක ඇගයීම් යටතේ සම්මාන අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට අවස්ථාව නොලැබේ.

එබැවින් පහත සඳහන් කොන්දේසීන් සම්පූර්ණ කර ඇති දෙවන වරට පාසල් අයදුම්කරුවෙකු ලෙස ඉදිරිපත් වන සිසුවෙකු පළමු වසරේ දී ඔහු විසින් ලැබූ පාසල පදනම් කරගත් ඇගයීම් සම්මාන සමාර්ථය උසස් පෙළ සඳහා අවශ්‍ය සම්මානයක අවශ්‍යතාවයට හිලව් කර ගත හැකි වේ. මෙම සම්මාන අවශ්‍යතාවය ගණිතය හා මාධ්‍ය භාෂාව ගත විෂයන් සඳහා වන අවශ්‍යතාවයනට යොදවා ගත නොහැක.

හිලව් කර ගන්නා පාසල පදනම් කරගත් ඇගයීම් සම්මාන සාමාර්ථය සඳහා ඊට අදාළ විෂයය පෙර වර්ෂයේ හා අදාළ වර්ෂයේ ලිඛිත විභාගයෙන් සමත්වී තිබිය යුතුය.

මේ අනුව සුදුසුකම් ලබා ඇති සිසුන් නියමිත සුදුසුකම් සපුරා ඇති ලෙස සලකා උසස් පෙළ පංතියට ඇතුළත් කිරීමට හැකිය.

ටෙජලා ටාරා ද මැල්,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

පිටපත්.

1. විභාග කොමසාරිස් ජනරාල්,

C:\My Documents\Memo to Schools.doc